# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම-2025
## පුරවැසි අධ්‍යාපනය

විභාග අංකය / නම : ..........................................................................................................................................

| 8 ශ්‍රේණිය | | කාලය පැය 02 |
|---|---|---|

## I - කොටස

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **ප්‍රශ්න අංක 01 සිට 05 දකවා දී ඇති හිස්තැනට නිවැරදි වරණය වරහන් තුළින් තෝරා ලියන්න.**

(1) ජනතාවගේ ජීවන තත්තවයේ ගුණාත්මක සංවර්ධනය උදෙසා රජය හා පෞද්ගලික අංශය මගින් සපයන සේවා ..................... නම් වේ.

(2) ඉන්දියාව හා ..................... ලොව දක්නට ලැබෙන ප්‍රබල බහු සංස්කෘතික රටවල් දෙකකි.

(3) ..................... යනු අනුගාමිකයාට අනුව කටයුතු කරන්නාය.

(4) වර්තමාන මිනිසාගේ වුවමනා හා අවශ්‍යතා බොහෝ සෙයින් ..................... වී තිබේ.

(5) පාසල් සිසුන් සඳහා මෙරට හඳුන්වා දී ඇති විශේෂ බස්රථ සේවයකි ..................... .

(නායකයා / පොදු සේවා / සිසු සැරිය / සංකීර්ණ / ඇමරිකා එක්සත් ජනපදය / ගැමි සැරිය)

- **ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රකාශන හරිනම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.**

(6) ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංස්කෘතීන් හැඩගැසී ඇත්තේ ආගම මුල්කර ගෙනයි. (     )

(7) නිවසක් තුළ නිදහස් සාමකාමී පරිසරයක් පැවතීම ඔබේ හැකියා වර්ධනය කර ගැනීමට ආධාර වේ. (     )

(8) පක්ෂග්‍රාහී වීම ප්‍රජාතන්ත්‍රවාදී නායකයකු සතු විය යුතු ගුණාංගයකි. (     )

(9) බැණ වැදීම සතුට කැමති චිත්තවේගයට දක්වන ප්‍රතිචාරයකි. (     )

(10) සන්නිවේදන හැකියාව නායකයෙකු සතුවිය යුතු ගුණාංගයකි. (     )

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න සඳහා A හා B තීරු නිවැරදිව ගලපා අදාල ඉංග්‍රිසි අක්ෂරය වරහන තුළ ලියන්න.**

| | A | | | B |
|---|---|---|---|---|
| (11) | විවිධ උත්සව කටයුතු සංවිධානය | (     ) | A | ආත්ම විශ්වාසය |
| (12) | අභියෝග ජය ගැනීමට අවශ්‍ය වේ. | (     ) | B | අධ්‍යාපන සේවා |
| (13) | බ්‍රිතාන්‍ය පාලන යුගයේ ආරම්භ කළ සේවාවකි. | (     ) | C | පරිසරය රසවිදීම |
| (14) | මනස සන්සුන් කිරීමේ අභ්‍යාසයකි. | (     ) | D | දීපවාලී |
| (15) | හින්දු සංස්කෘතියට අයත් උත්සවයකි. | (     ) | E | බැංකු සේවා |
| | | | F | පවුලේ සියලු දෙනා එක් වී ගන්නා විශේෂ තීරණයකි. |

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්න වල දී වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(16) ඇමරිකා එක්සත් ජනපදයේ ජීවත්වන ජන වර්ගයක් වන්නේ,

(i) බෙංගාලි (ii) ඇලස්කානුවන්

(iii) චක්මා (iv) බන්ජාරා

(17) පාසල් සිසුන් මුහුණ දෙන ගැටලුවක් නොවන්නේ,

(i) ආහාර හා පෝෂණ ගැටලුය. (ii) විභාග වලින් අසමත් වීමය.

(iii) ආර්ථික අපහසුතා ය. (iv) සුදුසු රැකියා නොලැබීමය.

(18) අධ්‍යාපනය මඟින් ඉටුකරන කාර්යයකි.

(i) සමාජානුයෝජනය කිරීම.

(ii) පාසල් ගොඩනැගිලි තැනීම.

(iii) රෝගීන් සුව කිරීම.

(iv) යහපත් පුරවැසියන් බිහි නොකිරීම.

(19) බැණ වැදීම, පහරදීම, අතපය වෙව්ලීම, වචන පැටලීම ආදී චිත්තවේ ඇතිවන්නේ,

(i) සතුට (ii) බිය

(iii) කෝපය (iv) දුක

(20) රජය විසින් නොමිලේ ලබාදෙන පොදු සේවාවකි.

(i) අධ්‍යාපනය (ii) විදුලිය

(iii) ප්‍රවාහනය (iv) තැපැල් සේවා

(ලකුණු 2 x 20 = 40)

## II - කොටස

- පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

---

(1)

(i) අප ප්‍රයෝජනයට ගන්නා පොදු සේවාවන් දෙකක් ලියන්න.

(ii) එදිනෙදා මුහුණ දෙන චිත්තවේග දෙකක් ලියන්න.

(iii) තැපැල් සේවය මගින් ජනතාවට සැපයෙන සේවා දෙකක් ලියන්න.

(iv) ළමා අයිතිවාසිකම් වර්ග කර ඇති තේමා දෙකක් නම් කරන්න.

(v) ඉන්දියානුවන් අදහන ආගම් දෙකක් ලියන්න.

(vi) අනතුරු හා විපත් ඒවායේ ස්වභාවය අනුව බෙදිය හැකි කොටස් දෙක නම් කරන්න.

(vii) කතෝලිකයන් විසින් සමරනු ලබන උත්සව දෙකක් ලියන්න.

(viii) බටහිර වෛද්‍ය ක්‍රමය යටතේ රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා පිහිටුවා ඇති රෝහල් දෙකක් ලියන්න.

(ලකුණු 2 x 8 = 16)

(2) (i) මහජනතාවට සපයන ආකාරය අනුව පොදු සේවා වර්ග කර දැක්විය හැකි ආකාර දෙකක් ලියන්න. (ල. 02)

(ii) පොදු සේවාවක් ලෙස පානීය ජලය සැපයීමට හේතු හතරක් ලියන්න. (ල. 04)

(iii) සෞඛ්‍ය සේවය මගින් ඉටු කරන කාර්යයන් පහක් ලියන්න. (ල. 05)

(3) (i) සමාජය තුළ නායකත්ව ලක්ෂණ දැකගත හැකි අවස්ථා දෙකක් ලියන්න. (ල. 02)

(ii) දූෂිත නායකයෙකු සතු ලක්ෂණ හතරක් ලියන්න (ල. 04)

(iii) ප්‍රජාතන්ත්‍රවාදී නායකයෙකු සතු විය යුතු ගුණාංග පහක් ලියන්න. (ල. 05)

(4) (i) ''සංස්කෘතිය'' පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ විද්වතුන් දෙදෙනෙකු නම් කරන්න. (ල. 02)

(ii) බහු සංස්කෘතික සමාජ පවතින රටවල් හතරක් ලියන්න. (ල. 04)

(iii) බහු සංස්කෘතික සමාජයක ලක්ෂණ පහක් ලියන්න. (ල. 05)

(5) (i) ශ්‍රී ලංකාවේ ජීවත් වන ජන වර්ග දෙකක් ලියන්න. (ල. 02)

(ii) බහු සංස්කෘතික රටක් වශයෙන් ඇමරිකා එක්සත් ජනපදය කටයුතු කිරීම සඳහා අනුගමනය කර ඇති ක්‍රියාමාර්ග හතරක් ලියන්න. (ල. 04)

(iii) බෞද්ධයින්ට ඉතා වැදගත් වන ආගමික උත්සව තුනක් නම් කර ඉන් එකක් වැදගත් වන ආකාරය කෙටියෙන් ලියන්න. (ල. 05)

(6) (i) පවුල තුළ දැකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 02)

(ii) සමාජය තුළ දැකිය හැකි නායකත්ව ශෛලීන් හතරක් ලියන්න. (ල. 04)

(iii) පවුලේ සියලු දෙනා එකට එකතු වී ''පවුලේ සාමාන්‍ය කටයුතු වලදී'' ගනු ලබන තීරණ පහක් ලියන්න. (ල. 5)

(7) (i) මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන විපත් දෙකක් ලියන්න. (ල. 02)

(ii) ගංවතුර ඇතිවීමට බලපාන මිනිස් ක්‍රියාකාරකම් හතරක් ලියන්න. (ල. 04)

(iii) නියඟය නිසා ඇතිවන අයහපත් ප්‍රතිඵල පහක් ලියන්න. (ල. 05)